# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1990/27 - 2016 ඔක්තෝබර් මස 27 වැනි බ්‍රහස්පතින්දා - 2016.10.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### මධ්‍යම පළාතේ පළාත් සභාව

### 1992 අංක 04 දරන මාර්ගස්ථ මගී ප්‍රවාහනය කිරීමේ ප්‍රඥප්තියේ 24(2)(1)(xii), (xiii) හා 24(3) සහ මධ්‍යම පළාතේ වර්ෂ 2000 අංක 01 දරන මගී ප්‍රවාහන සේවා අධිකාරි ප්‍රඥප්තියේ 20 වැනි වගන්තිය යටතේ පනවනු ලබන නියෝගය

1992 අංක 04 දරන මාර්ගස්ථ මගී ප්‍රවාහනය කිරීමේ ප්‍රඥප්තියේ 24(2)(1)(xii), (xiii) වගන්ති හා මධ්‍යම පළාතේ වර්ෂ 2000 අංක 01 දරන මගී ප්‍රවාහන සේවා අධිකාරි ප්‍රඥප්තියේ 20 වැනි වගන්තියෙන් මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන, ප්‍රවාහන, විදුලිබල හා බලශක්ති සහ නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය එදිරිවීර වීරවර්ධන වන මා වෙත පැවරී ඇති බලතල අනුව පහත නියෝග පනවනු ලබන අතර, එය මෙම ගැසට් පත්‍රය පළ වූ දින සිට බල පැවැත්විය යුතු බව ද, මෙයින් නියෝග කරමි.

මධ්‍යම පළාත තුළ මගී ප්‍රවාහන බස්රථ ධාවකයින් අතර පවත්නා දැඩි, අහිතකර තරගය හා මගී ජනතාවට ඇතිවන පීඩාව අවම කිරීම වෙනුවෙන් නව ප්‍රවාහන ක්‍රමවේදයක් හඳුන්වා දීම උදෙසා, වර්ෂ 2016.07.20 වැනි දින සිට 2016.10.19 වැනි දින දක්වා, මාර්ග ඒකක දෙකක ''සහසර'' නාමය යටතේ ක්‍රියාත්මක කරන ලද නියමු ව්‍යාපෘතිය නියාමනය කරන ලද මොරටුව විශ්වවිද්‍යාලයේ ප්‍රවාහන හා සැපයුම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් 2016.10.25 වැනි දින නිකුත් කරන ලද මධ්‍යම පළාත් මගී ප්‍රවාහන සේවා අධිකාරියේ බස් අංශ ප්‍රතිසංස්කරණ නියමු ව්‍යාපෘතියේ අතුරු වාර්තාවේ සඳහන් නිර්දේශය අනුව, මධ්‍යම පළාත් මගී ප්‍රවාහන සේවා අධිකාරියේ අවසරපත්‍රලාභී බස්රථ ධාවනයවන, සියලුම මාර්ගයන් හි යථෝක්ත 'සහසර' ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ යුතු ය.

එදිරිවීර වීරවර්ධන,
මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන, ප්‍රවාහන,
විදුලිබල හා බලශක්ති සහ නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය.

2016 ඔක්තෝබර් මස 27 වැනි දින,
මහනුවර,
මධ්‍යම පළාත් සභාවේ
මාර්ග සංවර්ධන, ප්‍රවාහන, විදුලිබල හා බලශක්ති සහ
නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය කාර්යාලයේ දී ය.

11-612


1A - PG 3197 — 22 (2016/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*